# සංහතික මාධ්‍ය යථාර්ථය සහ එහි සදාචාරීය දෘෂ්ටිවාදය

ආචාර්ය විශුබර් වීරසිංහ

සංහතික මාධ්‍ය සදාචාරය හා ආචාරධර්ම පිළිබඳ මතවාදයන් ශ්‍රී ලංකාවේ සමාජ සංස්කෘතික කරළියට මෑතක සිට ප්‍රවිෂ්ට වී ඇති බව පෙනේ. ලෝක සංහතික මාධ්‍ය ඉතිහාසය දෙස බැලුව ද සංහතික මාධ්‍ය සදාචාරය හා ආචාරධර්ම පිළිබඳ කතිකාව කාලයෙන් කාලයට ඉස්මතු වීම සාමාන්‍ය සංසිද්ධියකි. නිරුක්තිවේදයට හෝ පදෝත්පත්තියට අනුව සදාචාරය හා ආචාරධර්ම යන සංකල්ප හෝ අවබෝධන එක සමාන අර්ථයක් දරන බව සඳහන් කළ යුතු ය. ශ්‍රී ලංකාවේ 'සදාචාරය' හෝ 'ආචාරධර්ම' සංකල්පීය හා න්‍යායයික අවකාශය තුළ භාවිතයට එතරම් දීර්ඝ ඉතිහාසයක් නැති අතර, නමුත් "සදාචාර දර්ශනය යනුවෙන් බටහිර ලෝකයෙහි හඳුන්වනු ලබන ක්‍රියාවලියට සමාන ක්‍රියාවලියක් සහ ඊට අනුකූල වූ සංකල්පනා ද පෙරදිග ලෝකයෙහි නොවූ බව නිගමනය කළ නො හැකි ය" (ප්‍රේමසිරි, 1998). සදාචාරය යනු මානව සමාජයෙහි සමාජීය ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් වශයෙන් මිනිස් සම්බන්ධතා නියාමනය කිරීමේ යම් යම් පොදු පුරුදුපුහුණු ප්‍රතිමාන, සිරිත්-විරිත් ආදියේ සමස්තය යි. එය සමාජීය වශයෙන් බිහිවන ඓතිහාසික ප්‍රපංචය යි. සදාචාරය යනු සමාජය තුළ මිනිස් ක්‍රියාකාරකම් ප්‍රතිමානික ව, ආදර්ශනික ව, ප්‍රාමාණික ව නියාමනය කරන එක් මූලික ආකාරය යි; මාදිලිය යි. සදාචාරය සමාජ විඥානයේ විශේෂ ස්වරූපයක් වශයෙන් ඉදිරිපත් වන අතර ම එය සමාජ සම්බන්ධතාවල ප්‍රභේදයක් ද වන්නේ ය. සදාචාරය මානව සමාජයෙහි සියලු ම ක්ෂේත්‍රවල ක්‍රියාකාරකම් නියාමනය කරන්නේ ය. එය සමාජ ජීවිතයෙහි සියලු ම ක්ෂේත්‍රවල ආයතනවල ක්‍රියාකාරකම් නිගමනය කරනවා පමණක් නොව එම ක්‍රියාකාරකම් හා සම්බන්ධතා නිසි ප්‍රමිතියෙන් පවත්වාගෙන යෑම සඳහා ද ප්‍රමිල

ප්‍රයත්නයක් දරන්නේ ය. සදාචාරය මානව හරයේ සහ මානව පැවැත්මේ අවබෝධය පිළිබඳ සාමාස්තික අදහස්, මත පද්ධතියක පිළිබිඹුවක් වන අතර එය යුක්තයාත්මක පරිගතයක් තුළ ක්‍රියාත්මක වන්නේ ය. එහෙත්, සදාචාරය තුළ යුක්තයාත්මක ප්‍රවණතාව හා යථාර්ථවාදී ප්‍රවීණතාව සමග සෑම විට ම සමපාත නොවන්නේ ය. සදාචාරීය රාජ්‍ය සමාජයෙහි මිනිස් සම්බන්ධතා නියාමනයේ සෙසු නියාමන පද්ධති වන නෛතික, පාලන පරිපාලන ආදී පද්ධතිවලින් වෙන්ව හඳුනාගත යුතු ය. මෙහි දී විශේෂයෙන් අවධාරණය කළ යුතු වන්නේ සමාජයෙහි සදාචාරීය පද්ධති සහමූහික සමාජ භාවිතය, ව්‍යවහාරය තුළ හැඩ ගැසෙන බව යි. සදාචාරයේ මූලයන් සහ එහි පදනම් අප සෙවිය යුත්තේ විවිධ ආගමික, දාර්ශනික ඉගැන්වීම තුළ නොව මිනිසුන්ගේ සහමූහික ක්‍රියාකාරීත්ව චර්යාව සහ අන්‍යෝන්‍ය සමාශ්‍රය තුළ ය. ඒවා අන් කිසිවක් නොව මිනිසුන්ගේ ජීවන ව්‍යවහාරික, සංස්කෘතික, ඓතිහාසික අත්දැකීම්වල පරාවර්තනය කි. එසේ ම එය මිනිසුන්ගේ සහමූහික සහ පුද්ගලික සංකල්පනාවන්ගේ හා අධිෂ්ඨානයන්ගේ ද නිර්මාණය කි. මේ අනුව මිනිස් සමාජය තුළ සදාචාරාත්මක ආචාරධර්මීය සම්බන්ධතා බිහි වන්නේ සහ ඒවා ප්‍රතිනිෂ්පාදනය වන්නේ නිරන්තර වූ ද දෛනික වූ ද ජන, පොදුජන, සංහතික මානව ගතිසිරිත් පළපුරුදු, චර්යා, හැසිරීම් හා සම්ප්‍රදායන්, බලපෑම්, නියෝග ආදියෙහි බලපැවැත්ම හේතු කොටගෙන බව අවධාරණය කළ යුතු ය. මෙහි දී ජනමතය සහ සංහතික මතය සදාචාරීය සහ ආචාරධර්මීය සම්බන්ධතා නිර්මාණය වීමෙහි ලා සහ ඒවා පවත්වාගෙන යෑමෙහි ලා තීරණාත්මක වශයෙන් වැදගත් වන්නේ ය.

සමකාලීන රූපවාහිනී හෝ ශ්‍රව්‍ය-දෘශ්‍ය සංහතික මාධ්‍යයේ ක්‍රියාකාරීත්වයේ සාදාචාරාත්මක හෝ ආචාරධර්මීය හෝ පැතිකඩ විශ්ලේෂණය කිරීමට ප්‍රවිෂ්ට වීමට පෙර වර්තමාන මානව සමාජයෙහි නියාමන පද්ධතිවලින් එකක් ලෙස සැලකෙන සදාචාරයේ, ආචාරධර්මීය පද්ධතියේ සමකාලීන භූමිකාව සලකා බැලිය යුතු වන්නේ ය. මක්නිසා ද යත් සමාජීය පොදු සදාචාරීය හා ආචාරධර්මීය රාමුවෙන් තොර ව වෙනත් ආංශික සදාචාරීය හෝ ආචාරධර්මීය හෝ පද්ධතියක් ක්‍රියාත්මක විය නො හැකි බැවිනි.

සමාජයෙහි සදාචාරය හෝ ආචාරධර්ම හෝ සම්බන්ධ ව පොදුවේ පවතින ආකල්පය යථාර්ථවාදී, විද්‍යාත්මක ආකල්පයකට වඩා එය ව්‍යාජ, දෘෂ්ටිවාදී ආකල්පයකට සමීප බව මුලින් අවධාරණය කළ යුතු ය. වර්තමාන සමාජ පාලනය වන්නේ සදාචාරයට හෝ ආචාරධර්මවලට හෝ අනුකූල ව නො වේ. එහෙත් මානව සමාජ පරිණාමයෙහි ඉතිහාසයේ දී මිනිස් සම්බන්ධතා නියාමනය කිරීමේ ක්ෂේත්‍රය තුළ සදාචාරය යම් නිශ්චිත භූමිකාවක් ඉටු කර ඇති බව සඳහන් කළ යුතු ය. මානව සමාජ ඉතිහාසයේ මිනිස් සම්බන්ධතා නියාමනය කිරීමේ සුවිශේෂී වූ ද, ආධිපත්‍යයික වූ ද ක්ෂේත්‍රයක් තිබී හෝ ඉදිරියේ දී පැවැතිය නො හැකි ය. එහෙත්, මානව සමාජ පරිණාමයත් සමග බොහෝ සදාචාරාත්මක හෝ ආචාරධර්මීය හෝ ප්‍රතිමාන නෛතික රාමු දක්වා පරිවර්තනය වීම නිරීක්ෂණය කළ හැකි ය. එම ක්‍රියාවලිය භෞතික සංස්කෘතිය සහ පරිසරය මගින් තත්ත්වාරෝපණය කෙරේ. බොහෝ සාදාචාරාත්මක සහ ආචාරධර්මීය ප්‍රතිමාන ඒවා අභව්‍ය නිසා හෝ ඒවා අනුගමනය කිරීමට ඇති නොහැකියාව නිසා හෝ අභාවයට යන බව පෙනේ. නිදර්ශනයක් වශයෙන් බොරු කීමෙන් සහ රැවැටීමෙන් වැළකී සිටීම සමකාලීන මානව සමාජයෙහි කොන්දේසි යටතේ නො හැකි ය. එහෙත්, මිනිසා සහ සමාජීය සමස්ත බොරුවේ සහ රැවටීමේ වාතාවරණයෙන් යම් ප්‍රමාණයකට හෝ

ආරක්ෂා කිරීම සඳහා ඊට අදාළ නෛතික රාමු නිර්මාණය කර ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් වර්තමාන මිනිසුන්ගේ රැවටීමේ සහ බොරු කීමේ හැකියාව ඉතා ඉහළ මට්ටමක් දක්වා වර්ධනය කර ගැනීමට බාධා ඇති විය.

එසේ ම සදාචාරාත්මක හෝ ආචාරධර්මීය හෝ ක්‍රියා බහු අර්ථමය ස්වභාවයක්ද ගන්නේ ය. එක් සංස්කෘතියක් සඳහා උදාර ක්‍රියාවක් වන ක්‍රියාව වෙනත් සංස්කෘතියක් සඳහා අශිෂ්ට ක්‍රියාවක් විය හැකි ය. නිදර්ශනයක් වශයෙන් ද්වන්දව සටනක දී මියයෑම එක් මානව සමාජයක් සඳහා සදාචාරාත්මක ක්‍රියාවක් වන අතර, වෙනත් සංස්කෘතීන් සඳහා එය සදාචාරාත්මක නොවන ක්‍රියාවකි. මේ අනුව අපට පෙනී යන්නේ සියලු ම ජනතාවන්ට සහ සෑම කාලයකට ම මෙන් ම සෑම අවස්ථාවකට ම සරිලන පොදු නිර්ණායක හා නිර්වචනයක් සදාචාරය හා ආචාරධර්ම සඳහා ගොඩනගා ගැනීම කළ නො හැකි ය. මිනිසුන් විසින් සදාචාරාත්මක සහ ආචාරධර්මීය ප්‍රතිමාන නිර්මාණය කර ගන්නේ සමාජ හා පුද්ගලික ජීවන අරගලයෙහි ක්‍රියාත්මක ස්වාභාවික නියමයන්ගේ ක්‍රියාකාරී ක්ෂේත්‍රය සීමාකර ගැනීම සඳහා ය. එනම් සමුද්ධිත උපයෝග්‍යතාවේ නියමයන් සීමා කිරීම සදාචාරාත්මක හා ආචාරධර්මීය ප්‍රතිමානවල කාර්යභාරය වන්නේ ය.

සදාචාරය සහ ආචාරධර්ම පිළිබඳ අප ඉහත ගෙන හැර දක්වන ලද පොදු සංකල්පීය රාමුව තුළ සමකාලීන සංහතික මාධ්‍යයේ ස්වරූපයක් වශයෙන් ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍ය භාවිතයක් ලෙස රූපවාහිනී මාධ්‍යයේ සදාචාරාත්මක හෝ ආචාරධර්මීය පැවැත්ම හා ක්‍රියාකාරිත්වය අධ්‍යයනය කිරීම සඳහා අදාළ කරගත හැකි ය.

සංහතික සන්නිවේදන මාධ්‍යයන්ගේ ඓතිහාසික පරිණාමයේ දෘෂ්ටිකෝණයට අනුව විමසා බැලීමේ දී අපට පෙනී යන්නේ වියුක්ත ආචාරයේ හෝ ආචාරධර්මීය හෝ ප්‍රතිමානවලට අනුකූල ව සංහතික මාධ්‍යයේ ස්වරූපය හා ක්‍රියාකාරිත්වය හැඩ ගැසීමට එරෙහි ව පුද්ගල සහ සමාජ සදාචාරය හෝ ආචාරධර්මීය හෝ ගතිකයන් හැඩ ගැසීමෙහි ලා සංහතික සන්නිවේදන මාධ්‍ය පද්ධතිය සහ සංහතිකයින් අතර අන්තර් ක්‍රියාකාරිත්වය තීරණාත්මක සාධකයක් බවට පත් වී ඇති බවයි. වර්තමානයේ දී මෙම තත්ත්වය ඉතා පැහැදිලි ලෙස ප්‍රත්‍යක්ෂ කාරණයක් වන අතර, සමාජයෙහි ආධිපත්‍ය දරන සාම්ප්‍රදායික සදාචාරාත්මක හා ආචාරධර්මීය ප්‍රතිමාන කෙරෙහි සුවිශාල බලපෑමක් කරමින් එම වටිනාකම් සංහතික සන්නිවේදන මාධ්‍ය පද්ධති මඟින් තත්ත්වාරෝපණය කිරීම දක්වා ඒවායේ ශක්තිය හා හැකියාව වර්ධනය වී ඇති බව ප්‍රකට මතයකි. එහෙත්, සංහතික සන්නිවේදන මාධ්‍ය නියතවාදය පිළිගත යුතු ය යන්න ඉන් අදහස් නොවන බව වටහා ගත යුතු අතර, මෙහි දී මූලික වශයෙන් අවධාරණය කිරීමට උත්සාහ දරන්නේ සමකාලීන සංහතික සන්නිවේදන මාධ්‍ය පද්ධතිවල විශේෂයෙන් රූපවාහිනිය වැනි ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍යවල හා අද්‍යතනයේ දී ඉතා ශීඝ්‍ර ලෙස වර්ධනය වන අභිසාරිතා මාධ්‍ය අවකාශයේ වර්ධනය හා ව්‍යාප්තිය සමකාලීන සංහතික සන්නිවේදන මාධ්‍ය පද්ධතිය ඒකීය සාමස්තික සංකීර්ණයක් ලෙස සමාජ ක්‍රියාවලියට සිදු කරනු ලබන සාම්ප්‍රදායික බලපෑමේ මට්ටම හා ප්‍රමාණය අබිබවා සමාජ-සංස්කෘතික ව්‍යුහ නිර්මිතයේ ක්‍රියාකාරී අන්තර් සංරචකයක් බවට පත් වී තිබේ. සාම්ප්‍රදායික ව සංහතික මාධ්‍ය සතු ව තිබූ තොරතුරු රැස් කිරීම සංස්කරණය, ව්‍යාප්ත කිරීම, සම්ප්‍රේෂණය ආදි කාර්යයන්ට පමණක් අද්‍යතන සංහතික සන්නිවේදන මාධ්‍යවල කාර්ය සීමා වී නැති අතර, අද තොරතුරු බහුලීකරණය කිරීම, තොරතුරු නිෂ්පාදනය, ඒවා තොරතුරු කර්මාන්තයේ

අවශ්‍යතාවලට අනුව හැඩ ගැස්වීම පමණක් නොව, තොරතුරු හා විඥාපන ක්ෂේත්‍රය මත සිය ආධිපත්‍ය පවත්වාගෙන යෑම ඇතුළත් බහුකාර්ය පද්ධතියක් ඉටු කරමින් සංහතික මාධ්‍ය සමාජය තුළ වඩාත් විවිධ සහ බරපතළ ප්‍රපංචයක් බවට පත් වී ඇත. සංහතික මාධ්‍ය වර්තමාන අප සමාජයෙහි සුවිශේෂ සාමස්තික ක්ෂේත්‍රයක් බවට පත් වී ඇත.

මේ අනුව අද්‍යතන සංහතික මාධ්‍යයේ සමකාලීන සමාජ-සංස්කෘතික භූමිකාව අප අවබෝධ කර ගත යුත්තේ සමාජය තුළ ජීවත් වන දසලක්ෂ සංඛ්‍යාත සංහතික ජනයාගේ සංවේද්‍යතාව, හැඟීම්, විඥානය, චින්තනය, රසඥතාව මෙන් ම බුද්ධි මට්ටම හැඩගැස්වීමේ අති ප්‍රබල උපකරණයක් පමණක් නො ව, යම් නිශ්චිත බලවේගවලට තමන්ට ආවශ්‍යයික ප්‍රවණතාවක් ඔස්සේ සංහතිකයින් මෙහෙයවීම සඳහා ක්‍රියාකාරී බලපෑමක් සිදු කළ හැකි ප්‍රබල උපකරණයකි. මේ අනුව වර්තමාන සංහතික මාධ්‍ය සමකාලීන ජීවිතයේ වැදගත් සාධකයක් ව පැවැතෙමින් සමාජ ජීවිතයේ ක්ෂේත්‍රයක් නියෝජනය කරන්නේ ය.

මානව සමාජ පරිණාමය දෙස බැලීමේ දී සමාජයේ සදාචාරාත්මක හෝ ආචාරධර්මීය හෝ ගැටලුව උද්ගත වීමට වඩා වැඩි තීව්‍රතාවකින් හා සංවේදිතාවකින් සංහතික මාධ්‍යයේ සදාචාරාත්මක හෝ ආචාරධර්මීය හෝ ගැටලුව මතු වූ බව පෙන්වා දිය යුතු ය. සංහතික සන්නිවේදන මාධ්‍යයේ සදාචාරාත්මක ගැටලුව සමාජයෙහි සෙසු ක්ෂේත්‍රවලට අදාළ සදාචාරාත්මක හෝ ආචාරධර්මීය හෝ ගැටලුවලට වඩා තීව්‍ර සහ සංකීර්ණ වී ඇත්තේ එය අප ඉහත පෙන්වා දුන් ආකාරයට සමාජයෙහි සියලු ම ක්ෂේත්‍රවලට බලපෑමක් කිරීමට සමත් වූ සමකාලීන සමාජ සංවිධානයේ සුවිශේෂ පැතිකඩක් නිසා ම පමණක් නො ව, සංහතික සන්නිවේදන මාධ්‍යයේ ම ක්‍රියාකාරිත්වයේ ස්වභාවය සහ එය ක්‍රියාත්මක වන සමාජ සැකැස්මේ ස්වභාවය නිසා ම සංහතික මාධ්‍යයට ඇත්තේ සමාජයෙහි ජීවත් වන සදාචාරවාදීන් අපේක්ෂා කරනු ලබන හුදු වියුක්ත සදාචාරාත්මක හෝ ආචාරධර්මීය තත්ත්වයක් නො ව, අදාළ සමාජ සන්දර්භය තුළ ක්‍රියාත්මක වන සංහතික සන්නිවේදන මාධ්‍යයට ම ආවේණික වූ ඊට ම නෛසර්ගික වශයෙන් උරුම වූ සදාචාරයකි. එහෙත්, සංහතික මාධ්‍යයේ සැබෑ පැවැත්මට ක්‍රියාකාරිත්වයට එරෙහි ව නිරන්තර ව ම ඉස්මතු කරන එහි සදාචාරාත්මක හෝ ආචාරධර්මීය හෝ ගැටලු සම්බන්ධ කතිකාව සංහතික මාධ්‍ය දෘෂ්ටිවාදය වශයෙන් අප තේරුම් ගත යුතු ය.

මේ නිසා සමකාලීන සංහතික මාධ්‍යයේ විශේෂයෙන් රූපවාහිනී මාධ්‍යයේ සදාචාරීය ක්‍රියාකාරිත්වය හෝ ආචාරධර්මීය ක්‍රියාකාරිත්වය යනු පර්යේෂණාත්මක අනිශ්චේයකට වඩා උභතෝකෝටියකයකි. මේ අනුව සංහතික මාධ්‍ය සහ එහි සදාචාරීය පැවැත්ම හා ක්‍රියාකාරිත්වය පිළිබඳ සාම්ප්‍රදායික තර්කනය ප්‍රතික්ෂේප කිරීමේ අවස්ථාවකට අද අපි අවතීර්ණ වී සිටිමු. සංහතික සන්නිවේදන මාධ්‍යයන්ගේ සදාචාරීය පැවැත්ම හා ක්‍රියාකාරිත්වය පිළිබඳ කතිකාවේ අද්‍යතන සංහතික මාධ්‍යයේ තත්ත්වය සහ ප්‍රතිරූපය සමාජය තුළ ඔසවා තැබීමට ඉවහල් වන බව අපගේ අදහස යි.

සමාජ විද්‍යාත්මක දෘෂ්ටිකෝණයෙන් සංහතික මාධ්‍ය සහ එහි සදාචාරීය ගැටලුව විමසා බැලීමේ දී පෙනී යන්නේ සමකාලීන අප ජීවත් වන සමාජ සැකැස්මේ සන්දර්භය තුළ සංහතික මාධ්‍ය ඇතුළු ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍යයක් වශයෙන් රූපවාහිනී මාධ්‍යයේ කිසිදු

ආකාරයක සදාචාරාත්මක හෝ ආචාරධර්මීය හෝ පරිහානියක් දක්නට නොලැබේ. එහෙත්, සදාචාරවාදීන් හෝ සුචරිතවාදීන් ඉදිරිපත් කරන සමකාලීන රූපවාහිනී මාධ්‍යයේ ප්‍රකට සදාචාරාත්මක පරිහානිය බිඳ වැටීම එහි පැවැත්මේ හා ක්‍රියාකාරිත්වයේ සාමාන්‍ය ප්‍රතිමානක පරාසය යි. මෙය සදාචාරාත්මක පරිහානියක් හෝ රෝගී තත්ත්වයක් හෝ නො ව, මෙවැනි ආකාරයක සමාජයක සංහතික මාධ්‍ය සන්නිවේදනයේ පැවැත්මේ හා ක්‍රියාකාරීත්වයේ සාමාන්‍ය නිරෝගීමත් ආකාරය යි. එසේ ම වර්තමාන සංහතික මාධ්‍ය ඇතුළු රූපවාහිනී වැඩසටහන් නිෂ්පාදන ක්ෂේත්‍රයෙහි අර්බුදය සම්බන්ධ ජනප්‍රිය කතිකාව ද සමකාලීන අප ජීවත් වන සමාජයේ ස්වභාවයට සරිලන නියමානුකූලතාවක් ලෙස වටහාගත යුතු ය.

වර්තමානයේ ශ්‍රී ලාංකේය සංහතික මාධ්‍ය ක්ෂේත්‍රය පමණක් නො ව, ලෝකයේ බොහෝ රටවල ගෝලීය වශයෙන් සංහතික මාධ්‍ය ක්ෂේත්‍රය පසුවන තත්ත්වය අර්බුදාත්මක හා සදාචාරාත්මක පරිහානි තත්ත්වයක් ලෙස සුචරිතවාදීන් හඳුන්වා දෙමින් එය තාවකාලික හා නිවැරැදි කරගත හැකි තත්ත්වයක් ය යන ආකල්පය පතුරුවා හරියි. එම සුචරිතවාදීන්ගේ මූලික අදහස වන්නේ මෙම සංහතික සන්නිවේදන මාධ්‍ය මුහුණ පා ඇති සදාචාරාත්මක පරිහානිය හා අර්බුදය මාධ්‍ය අධ්‍යාපනය ශික්ෂණය හොඳ වැඩසටහන් නිර්මාණය කිරීම නිසා පහ ව ගොස් යහපත් සදාචාරාත්මක සංහතික මාධ්‍ය අවකාශයක් නිර්මාණය වන බව යි. එම ආකල්පය මිථ්‍යාව කි. එය යථාර්ථවාදී මෙන් ම විද්‍යාත්මක ද නොවේ.

වර්තමාන සංහතික මාධ්‍යය මඟින් සිය තත්ත්වය භූමිකාව හා ස්ථානය පිළිබඳ ව සමාජගත කර ඇති කතිකාවේ සමාජ සැකැස්ම පාදක බාහිර තර්කනයට අමතර ව සංහතික සන්නිවේදන මාධ්‍යයන්ගේ වර්ධනයේ අභ්‍යන්තර තර්කනය ද සමකාලීන ජනප්‍රිය සදාචාරාත්මක පරිහානිය හා අර්බුදයට පාදක ව ඇති තවත් පැතිකඩ කි.

මෙහි දී අප සලකා බලන්නේ මානව සමාජ පරිණාමීය ක්‍රියාවලියට සමගාමී ව සාපේක්ෂ වශයෙන් ස්වාධීන ක්ෂේත්‍රයක් හා ප්‍රවණතාවක් ලෙස සංහතික සන්නිවේදන මාධ්‍යය පද්ධතියේ ඓතිහාසික පරිණාමය සමන්විත බව ය.

අප කවුරුත් දන්නා පරිදි මානව ඉතිහාසයෙහි සන්නිවේදන හා තොරතුරු (විඥාපන) තාක්ෂණයේ හා තාක්ෂණිකවේදයේ වර්ධනයේ ප්‍රතිඵලයක් වශයෙන් යහපත් මෙන් ම අයහපත්, ධනාත්මක මෙන් ම සමානාත්මක තොරතුරු ද සමාජගත වීම සිදු විය. ඉතා මෑතක් වන තුරු ම තොරතුරු බහුලීකරණයේ සම්ප්‍රේෂණයේ ප්‍රමුඛාධිපත්‍ය නූතන මාධ්‍යයන් සතු ව පැවැතියත් වර්තමානය වනවිට නව මාධ්‍ය නිසා එම ආධිපත්‍ය බිඳ වැටී ඇති අතර, ඕනෑ ම පුද්ගලයකුට ඕනෑ ම තොරතුරක් ඕනෑ ම අවස්ථාවක දී ලබාගැනීමේ හා යැවීමේ හැකියාව හිමි වී තිබේ. මෙය සමකාලීන සංහතික මාධ්‍ය කතිකාවේ නව මානයක් විවෘත කළ අතර, සංහතික සන්නිවේදන මාධ්‍ය සදාචාරයේ හා එහි සමාජ අර්බුදයේ ප්‍රකට, ජනප්‍රිය කතිකාවට නව ප්‍රවේශයක් ද එකතු කළේ ය.

නූතන මාධ්‍යය (පුවත්පත්, සඟරා, රූපවාහිනිය, ගුවන්විදුලිය) නව මාධ්‍ය (අන්තර්ජාලය හා බැඳි සියලු සන්නිවේදන ස්වරූප) නූතන මාධ්‍ය මඟින් සාම්ප්‍රදායික ව ස්ථාපනය කර තිබූ සියලු යල් පැනගිය තොරතුරු සම්ප්‍රේෂණයේ ආකෘති විනාශය කරා ගමන් කරමින් සංහතික මාධ්‍ය පඨිතවල නිදහසේ නව යුගයක් සනිටුහන් කරන්නේ ය.

මේ තත්ත්වය සංහතික සන්නිවේදන මාධ්‍ය සදාචාරයේ හා අර්බුදයේ ප්‍රකට හා ජනප්‍රිය දෘෂ්ටිවාදයට නිර්විකල්පීය තත්ත්වයකට පරිවර්තනය කළේ ය. සංහතික මාධ්‍යකරණයේ නව නව යථාර්ථය හා එහි හැකියාවන් තොරතුරු නිෂ්පාදනයේ සහ බහුලීකරණයේ නව අවධියක් සනිටුහන් කරමින් මූලික වශයෙන් ලෝකය වෙනස් කළේ ය. මෙය සංහතික මාධ්‍ය සංස්කෘතිය විපරිවර්තනයට භාවිතය කළ පළමු විචලනය වන්නේ ය.

ලෝක මාධ්‍ය ඉතිහාසයෙහි මාධ්‍ය සංස්කෘතියට සුවිශාල බලපෑමක් සිදු කරමින් මාධ්‍ය නිදහස සහ මාධ්‍ය සදාචාරය පිළිබඳ ඓතිහාසික විමර්ශක ලක්ෂ්‍ය කීපයක් අපට ගෙන හැර දැක්විය හැකි ය. මෙය මාධ්‍යයේ සංවර්ධනයේ අභ්‍යන්තර තර්කනය ඔස්සේ සංහතික මාධ්‍ය පර්යන්තවල ගෝලීය විමුක්තියේ ගමන් මඟ සනිටුහන් කරන්නේ ය. මෙය සමකාලීන ජාතික හා ගෝලීය සංහතික සන්නිවේදන මාධ්‍ය සංස්කෘතියේ සදාචාරාත්මක සහ අර්බුදාත්මක කතිකාවේ යථාර්ථය හා එහි විද්‍යාත්මක පදනම පසක් කර ගැනීමට ඉවහල් වන බව අපගේ හැඟීම යි.

පැරණි ඊජිප්තුවෙහි ප්‍රථම පොදු ජන ලියුම (Demotic Letter) නිර්මාණය කිරීම මඟින් ලේඛනයේ විමුක්තිය උදා විය. ලේඛනය ක්‍රමානුකූල ව රාජ මාලිගාවලින් හා දේවස්ථානවලින් පිටතට පැමිණි අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් තොරතුරු මත වූ ප්‍රභූ ආධිපත්‍ය බිඳ වැටුණේ ය. මෙම ක්‍රියාවලිය ශත වර්ෂ ගණනාවක් තිස්සේ සිදු වූ අතර, එය රාජධානිවල බිඳ වැටීමට බලපාමින් නව ශිෂ්ටාචාරවල ආරම්භයට මඟ පෑදී ය. ගෝලීය පර්යන්ත විමුක්තියේ දෙවන අවස්ථාව ගුටෙන්බර්ග්ගේ මුද්‍රණ යන්ත්‍රයත් සමඟ සම්බන්ධ අතර, ක්‍රමානුකූල ව පොත්, සඟරා, පුවත්පත් ආදිය මුද්‍රණය ආරම්භ වූ අතර, එය පාඨනයේ විමුක්තිය (කියවීමේ විමුක්තිය) උදා කළේ ය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රතිසංස්කරණ ව්‍යාපාර, ආගමික යුද්ධ, දේශපාලන විප්ලව මෙන් ම විද්‍යා-තාක්ෂණික ප්‍රගතිය ද ඇති කළේ ය. එහි ප්‍රතිඵලය වූයේ නූතන සමාජය බිහිවීම යි. වර්තමානයේ දී අපි සියලු දෙනා ම ගෝලීය පර්යන්ත විමුක්තියේ තෙවන අවස්ථාවේ සාක්ෂිකරුවෝ වෙමු. මෙය අන්තර්ජාලය සමඟ සම්බන්ධ වූ කර්තෘත්වයේ විමුක්තිය යි. මේ තත්ත්වය යටතේ ඕනෑ ම පුද්ගලයකුට සිය අදහස් ඕනෑ ම ආකාරයකින් ඕනෑ ම අවස්ථාවක දී කිසි ම සීමා කිරීමකින් තොර ව වෙනත් පුද්ගලයකුට ඉදිරිපත් කිරීමේ සහ ඔහුගෙන් ප්‍රතිචාර ලබාගැනීමේ අවස්ථාව උදා වී ඇත. මෙය ඇත්ත වශයෙන් ම සංහතික මාධ්‍යයේ අභ්‍යන්තර තර්කනයේ වර්ධනයේ උපරිමාක්ෂය වන අතර, මාධ්‍ය පර්යන්ත මත සාම්ප්‍රදායික ආධිපත්‍ය, පාලනය එහි පැරණි ස්වරූපයෙන් සිය අවසානය කරා ළඟා වී ඇති අතර, එසේ ම සංහතික මාධ්‍ය නිදහස සහ සංහතික මාධ්‍ය සදාචාරය සම්බන්ධ ජනප්‍රිය දෘෂ්ටිවාදයේ ප්‍රබලතාව හීන වෙමින් පවතී.

විශේෂයෙන් ම සංහතික මාධ්‍ය සදාචාරය පිළිබඳ උනන්දුව වර්ධනය වන්නට වූ නූතන ඉතිහාසයේ වැදගත් සන්ධිස්ථානයක් වන්නේ 20 වන සියවස ආරම්භයේ දී ධනේශ්වර නිෂ්පාදන ක්‍රමයේ ක්ෂේත්‍රයක් වශයෙන් සංහතික මාධ්‍ය ක්‍රියාත්මක වන්නට වීම තුළ බටහිර යුරෝපයේ සහ අමෙරිකා එක්සත් ජනපදයේ මාධ්‍ය ඒකාධිකාරී නිර්මාණය වීමේ පසුබිම තුළ ය. සංහතික මාධ්‍ය පුළුල් ලෙස දේශපාලන හා ආර්ථික ක්‍රියාවලියට සම්බන්ධ වන්නට වූ අතර, එය සංහතික විඥානය මෙහෙයවීමේ හා පාලනය කිරීමේ උපකරණයක් බවට පත් විය. මේ අනුව සංහතික මාධ්‍ය වේගයෙන් වර්ධනය වන්නා වූ බටහිර යුරෝපීය හා අමෙරිකානු ධනේශ්වර සමාජයේ පොදු නියමයන්ට අනුකූල වන ලෙස හැඩ ගැසීමේ ප්‍රවණතාව ඉස්මතු වූ අතර, ඊට ප්‍රතිචාර වශයෙන්

සුචරිතවාදීන් සහ සමහර මාධ්‍යකරුවන් මාධ්‍ය සදාචාරය හෝ මාධ්‍ය ආචාරධර්ම පිළිබඳ හෝ කතිකාව ආරම්භ කළේ ය. 20 වන සියවසේ දෙවැනි භාගය වන විට සංහතික මාධ්‍ය නියාමන සදාචාර හා ආචාරධර්මීය සංග්‍රහ ලොව පුරා රටවල් බොහොමයක ම නිර්මාණය වන්නට විය. එම මාධ්‍ය සදාචාරාත්මක හෝ ආචාරධර්මීය සංග්‍රහ හෝ පවතින සංහතික මාධ්‍ය සංස්කෘතියේ හා සංහතික මාධ්‍ය කර්මාන්තයේ විවේචනයට ලක් වූ තත්ත්වයන් වෙනස් කිරීමට හැකියාවක් නොවූ අතර, එය ක්‍රමානුකූල ව සංහතික මාධ්‍යයේ සදාචාරීය දෘෂ්ටිවාදය බවට පත් විය.

විසිවන සියවසේ හැත්තෑව දශකයේ නව මාධ්‍යයන්ගේ ආගමනයත් සමඟ ම ලෝක සංහතික මාධ්‍ය සංස්කෘතිය වෙනස් වන්නට ආවශ්‍යයික පශ්චාත් න්‍යාය පදනම නිර්මාණය වූ අතර, විසිඑක්වන සියවසේ දෙවන දශකය වනවිට එය සංහතික මාධ්‍ය සදාචාරයේ හා අර්බුදයේ කතිකාව යළිත් වරක් කරළියට පැමිණියේ ය. මේ සියල්ල සැලකිල්ලට ගනිමින් අද්‍යතන ජාතික සහ ගෝලීය සංහතික මාධ්‍ය නියාමනය කළ යුතු ය යන දෘෂ්ටිවාදය එන්න එන්න ම ප්‍රබලතාවකින් යුතු ව ලොව පුරා විවිධ සමාජ දේශපාලන ව්‍යාපාර ඔස්සේ ක්‍රියාත්මක බව පෙන්වා දිය යුතු ය.

අද්‍යතන සංහතික මාධ්‍යයේ සදාචාරය එය ක්‍රියාත්මක වන සමාජ සැකැස්මේ නියමයන්ගෙන් පරිබාහිර ව ගෙන, එය සදාචාරාත්මක කිරීමට දරන ප්‍රයත්නය නිෂ්ඵල වන්නේ ය.

මේ අනුව සමකාලීන සංහතික මාධ්‍ය සදාචාරය එක් අතකින් පර්යේෂණාත්මක අනිශ්චේයක් වශයෙන් ද අනෙක් අතින් උභතෝකෝටිකයක් වශයෙන් ද වටහා ගැනීම සඳහා සමකාලීන සංහතික මාධ්‍යයේ වර්ධනයේ අභ්‍යන්තර තර්කනයත් එහි පැවැත්මේ හා ක්‍රියාකාරිත්වයේ සමාජ සන්දර්භයේ තර්කනයත් බල කරන්නේ ය.

අපගේ අදහස වන්නේ සමකාලීන සංහතික මාධ්‍ය පමණක් නො ව, සමාජ ජීවිතයේ අනෙක් ඕනෑ ම ක්ෂේත්‍රයක යම් කිසි හෝ වෙනසක්, විපරිවර්තනයක් කිරීමට අවශ්‍ය නම් ඒ සඳහා සදාචාරයේ හෝ ආචාරධර්මීය නියාමන යාන්ත්‍රණය හෝ කිසි සේත් ම ප්‍රමාණවත් සහ යථාර්ථවාදී නො වන අතර, ඒ සඳහා ඊට වඩා එහා ගිය වෙනත් නියාමන යාන්ත්‍රණයක් යොදාගත යුතු ය. එහි දී අනාදිමත් කාලයක් පුද්ගල සහ සමාජ විඥානය හා චර්යා නියාමනය කළ සදාචාරීය හා ආචාරධර්මීය යාන්ත්‍රණය මෙන් ම හිමිකම් හා නෛතික යාන්ත්‍රණය ද ඒකාබද්ධ ව නිර්මාණය කරගන්නා ලද යුක්තිවේදීය සංහතික මාධ්‍යවේදයක් (Denotological Journalism) සහ ඊට අනුයුක්ත යුක්තිවේදීය දෘෂ්ටිවාදයක් (Deontological Ideology) නිර්මාණය කළ යුතු ය.

ඇත්ත වශයෙන් ම යුක්තිවේදය එක් අතකින් සදාචාරාත්මක, ආචාරධර්මීය ප්‍රතිමාන සමඟ සම්බන්ධ අතර, අනෙක් අතින් එය හිමිකම් පරාමිතීන් සමඟ සම්බන්ධ වේ. මීට අමතර ව මෙම යුක්තිවේදී මූලධර්ම නෛතික පැතිකඩ සමඟ ද සම්බන්ධතාවන් පෙන්නුම් කරන්නේ ය. මේ අනුව යුක්තිවේදීය සංහතික මාධ්‍යවේදය ආචාර්ධර්මික, නෛතික සහ හිමිකම් යන සංකල්පීය ත්‍රිත්වයේ සංශ්ලේෂීය සහ ඓන්ද්‍රිය සුසංයෝගය කි. දැනට සංහතික මාධ්‍ය නියාමනය සහ හැසිරවීම සම්බන්ධ ව වෙන් වෙන් ව භාවිතයට ගන්නා මාධ්‍ය නීතිය, මාධ්‍ය ආචාරධර්ම සහ මාධ්‍ය හිමිකම වෙනුවට ඊට වඩා ඵලදායිතා සහ කාර්යක්ෂම ලෙස යුක්තිවේද යොදාගත හැකි ය. යුක්තිවේදය සමකාලීන සංහතික මාධ්‍ය සංස්කෘතිය තුළ වාත්තීයමය, නිර්මාණාත්මක

කර්මාන්තමය සහ ව්‍යාපාරික සම්බන්ධතා නියාමනය හා හැසිරීමේ නව භාවිතයක් වශයෙන් යොදා ගැනීමේ ශක්‍යතා සොයා බැලිය යුතු ය.

යුක්තිවේදී සංහතික මාධ්‍යවේදය යනු පොදු යුක්තිවේදීය මූලධර්ම සහ භාවිතයන් සංහතික මාධ්‍ය සහ සංහතික සන්නිවේදන ක්ෂේත්‍රයට අදාළ කර ගැනීම යි. සංහතික මාධ්‍ය ක්ෂේත්‍රයෙහි ක්‍රියාකාරකයින් හැසිරිය යුතු ආකාරය, ඉදිරිපත් විය යුතු ආකාරය, එනම් සංහතික මාධ්‍යවේදියාගේ යුතුකම් සංකීර්ණයක් ලෙස මෙය අර්ථ දැක්විය හැකි ය.

යුක්තිවේදය යනු යුතුකම ඉටු කිරීමේ විද්‍යාත්මක වූ ද නෛතික වූ ද සදාචාරීය වූ ද ස්වරූපය කි. මේ අනුව යුක්තිවේදී සංහතික මාධ්‍යවේදය යනු නිශ්චිත තොරතුරු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමේ පළල් ප්‍රතිමාන පද්ධතියක් ලෙස සැලකිය හැකි ය. සංහතික මාධ්‍යවේදයට අදාළ සියලු කාර්යයන් ගෞරවාන්විත ව, නිර්මාණාත්මක ව ඉටු කිරීම සඳහා පාදක වන විවිධාකාර ප්‍රතිමානවල සංස්කෘතික පද්ධතිය ලෙස යුක්තිවේදීය සංහතික මාධ්‍යවේදය හඳුනාගත හැකි ය. සංහතික මාධ්‍යවේදී යුතුකම වෘත්තීය සම්බන්ධතාවන්ගේ සමස්තයක් ලෙස සැලකිය යුතු අතර, එම සම්බන්ධතා පද්ධතිය සමාජ ආයතනයක් ලෙස සංහතික මාධ්‍ය ක්‍රියාකාරිත්වය මඟින් තත්ත්වාරෝපණය වන්නේ ය. එම නිසා සංහතික මාධ්‍යකරුවාගේ සියලු කාරණයන් සහ ඔවුන්ගේ විඥානය යුතුකම් අවකාශයට අයත් වන්නේ ය.

සෙසු සමාජ ක්‍රියාකාරීන්ට වඩා සංහතික මාධ්‍යකරුවන්ගේ 'සමාජ යුතුකම' පිළිබඳ ආකල්පය සුවිශේෂී ස්වරූපයක් ගන්නා බව සඳහන් කළ යුතු ය. සංහතික මාධ්‍යකරුවන් සිය සමාජ යුතුකම ඉටු කිරීමට යෑමේ දී උභතෝකෝටික පරස්පරතාවලට මුහුණපාන බව පෙන්වා දිය යුතු ය. සංහතික මාධ්‍යකරුවාගේ සමාජ යුතුකම විය යුත්තේ සමාජයේ එක් කොටසකගේ, පන්තියක, ජාතියක, රටක යුතුකම වෙනුවෙන් ඉදිරිපත් වීම ද, එසේ නො වේ නම් සමස්ත මානව සංහතියේ ම යුතුකම වෙනුවෙන් ඉදිරිපත් වීම ද, යම් සංහතික මාධ්‍යකරුවකු සමස්තය මඟ හැර කොටස වෙනුවෙන් ඉදිරිපත් වන්නේ ද, එසේ ම කොටස මඟ හැර සමස්තය වෙනුවෙන් ඉදිරිපත් වන්නේ ද යන්න ය. මෙහි දී සංහතික මාධ්‍යකරුවා 'ඒ හෝ මේ' අන්තය තෝරා ගැනීම සිදු කරන්නේ නම් ඉන් කොටසට මෙන් ම සමස්තයට ද එක සේ විශාල ලෙස හානි සිදුවිය හැකි ය.

මේ අනුව සංහතික මාධ්‍යකරුවාගේ යුක්තිවේදී විඥානය සකස් විය යුතු ආකාරය පිළිබඳ ව ඉතා වැදගත් නිගමනයකට අපට අවතීර්ණ විය හැකි ය. එනම් ජාතික, ගෝලීය, පාන්තික, නිර්පාන්තික කොටස් ඒකීය සමස්තයක් ලෙස නියෝජනය වන ආකාරයේ අපෝහක සම්බන්ධතාවක් තුළ සමාජය ක්‍රියාත්මක වී නම් හා එය සංවර්ධනය වීමේ නියමානුකූලතාවන් අවබෝධ කර ගැනීම යි. ඒ අනුව අදාළ නිශ්චිත අවස්ථාවල දී සමාජ යුතුකම ක්‍රියාවෙහි යෙදවීමේ ස්වරූපය තීරණය වනු ඇත.

## ආශ්‍රිත ග්‍රන්ථ

1. පී.ඩී. ප්‍රේමසිරි, 1998, ආචාර විද්‍යාව, ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන